ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.02.14 *චක්‍රලේඛ අංක : 13 /2026*

**දිසා කොමසාරිස් වරුන් වෙත,**

***මහත්මයාණෙනි/මහත්මියනි,***

**<u>බේඩන් පවල් දින සැමරුම (Baden Powell Day Celebration) - 2026</u>**

ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘ බේඩන් පවල් සාමිවරයාගේ ජන්ම දිනය යෙදෙන පෙබරවාරි මස 22 වන දින "ලෝක බාලදක්ෂ දිනය" සමරමින් ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් විශේෂ වැඩසටහන් පැවැත්වීමට ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය තීරණය කර ඇත. ඒ අනුව එම වැඩසටහන් පහත පරිදි පැවැත්වේ.

**1. ජාතික වැඩසටහන - (කොළඹ සහ ගාල්ල)**

- කොළඹ දී පැවැත්වෙන කෙටි ජාතික සැමරුම් වැඩසටහන ගරු අග්‍රාමාත්‍ය තුමියගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවැත්වේ.
- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් සංවිධානය කරනු ලබන ජාතික වැඩසටහන ගාලු දිසාවේ සත්කාරකත්වය යටතේ ගාල්ලේ දී පැවැත්වේ.
  - යෝජිත වැඩසටහන ආරම්භය - පෙ.ව 10.00 ට
  - සරුංගල් තරඟය - ප.ව 3.00 (සියලුම දිස්ත්‍රික්කයන්ට විවෘත වේ)
  - සහතිකපත් ප්‍රදානය - ප.ව 5.00 ට
  - බිපී දින සැමරුම - ප.ව 6.00 ට
  - මහජන ගිණිමැලය - ප.ව 7.00 ට

  (මෙම වැඩසටහන ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ Facebook සහ You Tube හි සජීවීව විකාශය වේ.)

**වැඩිදුර තොරතුරු සඳහා - ජාතික බාලදක්ෂ මූලස්ථානය**

1. දේශාන් මිලින්ද මහතා - සහය ප්‍රධාන කොමසාරිස් (සංවර්ධන) – 0740 949343
2. දමිත් චමින්ද මහතා - මූලස්ථාන කොමසාරිස් - 0773 362048

**2. දිසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

බීපී දිනය වෙනුවෙන් සෙසු දිස්ත්‍රික්ක දිසා මට්ටමින් සැමරුම් උත්සව සංවිධානය කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව ඔබ විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන වල තොරතුරු 2026 පෙබරවාරි මස 17 වන දිනට පෙර ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ මාධ්‍ය අංශයේ ලිපිකාරිණී දිලන්ති ශ්‍රීමාලි මහත්මිය වෙත 0112 433512 යන දුරකථන අංකයෙන් හෝ slscout2@yahoo.com යන ඊ මේල් ලිපිනයට දැනුම් දෙන ලෙස දන්වා සිටිමු.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk

එමෙන්ම දිසා බාලදක්ෂ සැමරුම් උත්සව සඳහා පළාත් කොමසාරිස්වරයකු / මුලස්ථාන කොමසාරිස්වරයකු හෝ සහය මුලස්ථාන කොමසාරිස්වරයකු මේ සඳහා සහභාගී කර වීමට කටයුතු කරනු ලැබේ.

තවද ඔබ දිසාවේ සහය දිසා කොමසාරිස් හෝ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය හා සම්බන්ධවී මේ සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටිමු.

**දිසා විමසීම් -** ජාතික සරුංගල් තරගාවලිය පිළිබඳ

1. චින්තක කෞෂල්‍යා මහතා, දිසා කොමසාරිස් - 0770049695
2. ලංකා තිළිණ මහතා, සහය දිසා කොමසාරිස් - 0767313849

ස්තූතියි
මෙයට
බාලදක්ෂ සේවයේ නියුතු





***ප්‍රභාත් කුලරත්න***
සහාය ප්‍රධාන කොමසාරිස්
(මාධ්‍ය/මහජන සම්බන්ධතා, ප්‍රවර්ධන)

***නිතීඥ මනෝජ් නානායක්කාර***
ප්‍රධාන කොමසාරිස්

පිටපත් - මුලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සභාපති,විධායක කමිටු සභාපති, ගරු ලේකම් ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය